# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2016/7 - 2017 අප්‍රේල් මස 24 වැනි සඳුදා - 2017.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 104/44

**භාර ආඥාපනත (87 වන පරිච්ඡේදය)**

114 වගන්තිය යටතේ නියෝගය

''ද පැස්ටෝරල් ෆෙලෝෂිප් භාරය'' භාරකරුවන්, එනම් -

1. පූජ්‍ය මේරි ජෝසප් ග්‍රීඩ් ජෙබකුමාර්
2. පූජ්‍ය කුප්පුසාමි විජයන්
3. පූජ්‍ය පැට්තා රාසරෙත්නම්
4. පූජ්‍ය කනපතිපිල්ලෙයි දෙයිවෙන්තිරන්

යන අය (87 වන අධිකාරය) වූ භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා වෙත ඔවුන්ගේ භාරය සංස්ථාගත කිරීම සඳහා අයදුම්කර ඇති හෙයින් ද,

එම නිසා, ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය, විජයදස රාජපක්ෂ වන මා විසින් ඉහත නම් සඳහන් භාරකරුවන් සංස්ථාගත කිරීම අනුමත කර, පහත පරිදි නිර්දේශ කර ප්‍රකාශයට පත් කිරීමට නියෝග කරමි.

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මයිකල් ෆෙඩ්රික් ස්ප්‍රවුල් විසින් සහතික කරන ලද අංක 4108 දරන සහ 2014 ඔක්තෝබර් මස 10 වැනි දිනැති සංශෝධන භාරකාර නිවේදනය මගින් සංශෝධිත වූ අංක 3932 දරන සහ 2012 අගෝස්තු 22 දිනැති භාරකාර නිවේදනය සහ එකී භාරය යටතේ දැනට නිසි පරිදි පත් කරන ලද ඉහත නම් දරන භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් ''ද පැස්ටෝරල් ෆෙලෝෂිප් භාරය'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු ය.

(ආ) එකී භාරය වෙනුවෙන් එකී නාමය සහ අභිධානය යටතේ චංචල හෝ නිශ්චල දේපොළක් මිලදී ගැනීමට, භාර ගැනීමට, රඳවා ගැනීමට, ණය ලබා ගැනීමට, හෝ අන්‍යාකාරයකින්, අත්කර ගැනීමට, විකිණීමට, හුවමාරු කිරීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට, බදු දීමට හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමට ඉහත නම් දරන භාරකරුවන්ට හැකියාව ඇත්තේ ය ; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයකදී හෝ වෙනත් ස්ථානයකදී එකී භාරය සම්බන්ධයෙන් පැන නැගෙන සියලු නඩු පවරනු ලැබීමට, උත්තර දීමට හා උත්තර ගොනු කිරීමට, විත්තිවාචික ඉදිරිපත් කිරීමට හා විත්තිවාචික ඉදිරිපත් කරනු ලැබීමට නීතිය අනුව එකී නාමය සහ අභිධානය මගින් භාරකරුවන්ට හැකියාව සහ බලය ඇත්තේ ය.

මා හට අවශ්‍ය බව පෙනී යන පරිදි, මෙම නියෝගය, අවස්ථානුකූලව අවලංගු කිරීම, කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2017 ක් වූ අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

05- 227


1A - G 25461 — 57 (2017/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*